SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: 1 | කාලය / மணித்தியாலம் / Hours: 01 |

නම ................................ විභාග අංකය .............................

**සැලකිය යුතුයි :**
- (i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- (ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට, දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- (iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
- (iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01. "තණ්හා,අරති,රගා" යන තිදෙනා

1 දේවතාවියන් ය. 2 බුද්ධ ශ්‍රාවිකාවන් ය.
3 මාර දූවරුන් ය. 4 සිටු කුමරියන් ය.

02. "අනේක ජාති සංසාරං ..... " යන ප්‍රකාශය,

1 උපතේ දී සිදු කළ සිංහ නාදයයි.
2 බුදු වූ පසු පළ කළ පළමු උදාන වාක්‍යයයි.
3 පළමු ධර්ම දූතයින්ට කළ අවවාදයයි.
4 අවසාන බුද්ධ වචනයයි.

03. බුදුරජාණන් වහන්සේ ඇතුළු භික්ෂූන්වහන්සේලා සිව්පස පහසුකම් ලබාගැනීම පිළිබඳ අභියෝගයකට මුහුණ දුන් වස්කාලය ගත කළේ,

1 වේරඤ්ජා පුරයේ ය. 2 ඉසිපතන මිගදායේ ය.
3 වේළුවනාරාමයේ ය. 4 මකුල පර්වතයේ ය.

04. බුදුරජාණන් වහන්සේ ඇතුළු මහ සඟරුවනට "අසදෘශ මහා දානයක්" පිළිගන්වන ලද්දේ,

1 බිම්බිසාර රජතුමා විසිනි. 2 කොසොල් රජතුමා විසිනි.
3 සුදොවුන් රජතුමා විසිනි. 4 උදේනි රජතුමා විසිනි.

05. "ලාභෝ අලාභෝ අයසෝ යසෝච ..... " යන ගාථාවෙන් අපට උගන්වනු ලබන්නේ,

1 ලෝක පාලන දහමයි. 2 අටලෝ දහමයි.
3 තිලකුණු දහමයි. 4 හේතු ඵල දහමයි.

06. යම් බෝසත්වරයෙකු දස පාරමී ධර්ම, පාරමී, උප පාරමී ලෙස විසි ආකාරයකින් සම්පූර්ණ කරන්නේ නම්, එම උතුමන් ගේ අරමුණ

1 ධ්‍යාන සම්පත් ලැබීමයි. 2 මහ රහත් බව ලැබීමයි.
3 පසේ බුද්ධත්වය ලැබීමයි. 4 සම්මා සම්බුදුබව ලැබීමයි.

07. බෝසතාණන් වහන්සේ බාහිර වස්තු දන් දෙමින් දාන පාරමී මට්ටම පුහුණු කළ අවස්ථාවක් පෙන්වා දෙන්නේ,

1 සස ජාතකයයි. 2 මඛාදේව ජාතකයයි.
3 සිස ජාතකයයි. 4 වෙස්සන්තර ජාතකයයි.

For Educational Purpose Only



SLGURU.LK

SLGURU.LK

08. "ආරම්භ ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු" යන අවස්ථා තුන අදාල වන්නේ,

1 සීල පාරමිතාවටයි. 2 නෙක්ඛම්ම පාරමිතාවටයි.
3 ප්‍රඥා පාරමිතාවටයි. 4 විරිය පාරමිතාවටයි.

09. "දූරංගමං ඒකචරං...... " යන ගාථාවෙන් පැහැදිලි කරනු ලබන්නේ,

1 සිතෙහි ස්වභාවයයි. 2 කයෙහි ස්වභාවයයි.
3 වචනයෙහි ස්වභාවයයි. 4 භවයෙහි ස්වභාවයයි.

10. සත්ත්වයා ලෙස සලකන පඤ්චස්කන්ධය බෙදා දැක්විය හැක්කේ,

1 මෙලොව පරලොව ලෙසයි. 2 රූප අරූප ලෙසයි.
3 දේව මිනිස් ලෙසයි. 4 නාම රූප ලෙසයි.

11. දහමෙහි "කෙලෙස්" යනුවෙන් හඳුන්වා ඇත්තේ,

1 සසර සැප ලබා දෙන පුණ්‍ය කර්මයන් ය.
2 ලෝභ දෝස මෝහ මූලික පව්වු සිතිවිලි ය.
3 නරක තිරිසන් ප්‍රේත ආදී දුගතීන් ය.
4 රූපාවචර අරූපාවචර ආදී ධ්‍යානයන් ය.

12. රුබෙල් ගුණවර්ධන දරුවා "රේරුකානේ චන්ද විමල" යන නමින් පැවිදි බිමට පත් කරන ලද්දේ,

1 අතිපූජ්‍ය රත්මලානේ ධර්මාරාම මා හිමියන් විසිනි.
2 අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මා හිමියන් විසිනි.
3 අතිපූජ්‍ය වැලිවිට සරණංකර මා හිමියන් විසිනි.
4 අතිපූජ්‍ය යු. විනයාලංකාර මා හිමියන් විසිනි.

13. සමාජයේ මිනිසුන් අතර දහම පිළිබඳව ඇති ප්‍රශ්න සියයකට පිළිතුරු ඇතුලත් කොට රේරුකානේ චන්දවිමල මා හිමිපාණන් රචනා කරන ලද ග්‍රන්ථය,

1 "පොහොය දිනය" නම්වේ.
2 "බෞද්ධයා ගේ අත්පොත" නම්වේ.
3 "ධර්ම විනශ්චය" නම්වේ.
4 "පාරමිතා ප්‍රකරණය" නම්වේ.

14. පහත ප්‍රකාශ වලින් රේරුකානේ චන්දවිමල මා හිමියන් ගේ ප්‍රකාශය තෝරන්න.

1 "මා පොත් රචනා කළේ මුදල් හම්බ කිරීමේ අදහසින් නොවේ."
2 "සිංහලයෙනි නැගිටිව් බුද්ධගයාව බේරාගනිව්."
3 "මාගේ මේ ව්‍යායාමය රජ සැප පිනිස නොවේ."
4 "සියලු මිනිසුන් මාගේ දරුවෝය."

15. ධම්ම පදය පිළිබඳව නොගැලපෙන පිළිතුර තෝරන්න

1 බෞද්ධයා ගේ අත්පොතය, නිදානකතා 299 කි.
2 සූත්‍ර පිඨකයේ ඛුද්දක නිකායට අයත්ය, වර්ග 26 කි.
3 අභිධර්මයේ ගැඹුරු දහම් සම්පිණ්ඩනයකි, ගාථා 550 කි.
4 බෞද්ධ ලෝකයාගේ මුදුන්මල්කඩය, හස්තසාර ග්‍රන්ථයකි.

16. බුදුරජාණන් වහන්සේ කෙලෙස් රහිත බැවින් ද, රහසින්වත් පව් නොකළ බැවින් ද, සියලු පූජාවන්ට සුදුසු වූ බැවින් ද,

1 "අරහං" නම්වන සේක.
2 "සම්මා සම්බුද්ධ" නම්වන සේක.
3 "සුගත" නම්වන සේක.
4 "ලෝකවිදූ" නම්වන සේක.



For Educational Purpose Only
SLGURU.LK

SLGURU.LK

17. බුදුරජාණන් වහන්සේ විසින් තමන් ගේ ගුරු තනතුරෙහි තබාගත්තේ,

1 පෙර විසූ බුද්ධ රත්නයන්ය.
2 ශ්‍රී සද්ධර්ම රත්නයන්ය.
3 අර්ය මහා සංඝ රත්නයන්ය
4 මුල් ගුරුවරුන් තිදෙනාය.

18. මහ සඟරුවනට අයත් භික්ෂූන් වහන්සේලා උපසම්පදා වීමට පෙර ආරක්ෂා කරන සීලය,

1 ආජීව අෂ්ඨමක සීලයයි.
2 උපෝසථ අෂ්ඨාංග සීලයයි.
3 සාමණේර සීලයයි.
4 උපසම්පදා සීලයයි.

19. සමථ භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන අතරින් එකකි,

1 අසහනය නැති වී ප්‍රසන්න පෙනුමක් ඇතිවීම.
2 මානසික රෝග සියල්ලම දුරු වී යාම.
3 ත්‍රිලක්ෂණය පූර්ණ ලෙස අවබෝධ වීම.
4 සියලු කෙළෙසුන් නැසීමට හැකිවීම.

20. " පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ඒවා

1 සතර කර්ම ක්ලේෂයන් ය.
2 සතර මහා භූත රූපයන් ය.
3 සතර ඍද්ධිපාදයන් ය.
4 සිව් රඟ සේනාවන් ය.

21. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ වැඩ වාසය කළේ,

1 අනුරාධපුර යුගයේ ය.
2 දඹදෙණි යුගයේ ය.
3 මහනුවර යුගයේ ය.
4 කෝට්ටේ යුගයේ ය.

22. දුටුගැමුණු මහා නරපතියාණන්ගේ ශාසනික මෙහෙවර යටතේ වූ ඉදි කිරීම්වලට අයත් වන්නේ

1 ථූපාරාමය හා අභයගිරියයි.
2 මහා සෑය හා ලෝවා මහා ප්‍රාසාදයයි.
3 ගල්විහාරය හා ආලාහන පිරිවෙනයි.
4 මහියංගන සෑය හා දිවා ගුහාවයි.

.23 උට්ඨානවතෝ........ යනාදී ධම්මපද ගාථාවෙහි ඇතුළත් " සඤ්ඤත" යන වචනයේ තේරුම

1 නොමැලිව කාර්යක්ෂමව වැඩ කිරීමයි.
2 දැහැමිව නීතිගරුකව ජීවත්වීමයි.
3 නුවණින් සිතා විමසා කටයුතු කිරීමයි.
4 ශීලයෙන් කය වචනය හික්මවා දිවි ගෙවීමයි.

24. දුශ්ශීලව නොසන්සුන් සිත් ඇතිව අවුරුදු සීයක් ජීවත් වීමට වඩා සිල්වත් ව සන්සුන් සිත් ඇතිව එක් දවසක් ජීවත්වීම ශ්‍රේෂ්ඨ ය. " මෙම අදහස ඇති ගාථා රත්නය

1 අනිච්චාවත සංඛාරා............. යන්නයි.
2 ආරෝග්‍යා පරමා ලාභා........... යන්නයි.
3 යථාපි මූලේ අනුපද්දවේ දළ්හේ........... යන්නයි.
4 යෝ චේ වස්සසතං ජීවේ ............ යන්නයි.


For Educational Purpose Only
SLGURU.LK

SLGURU.LK

25. සිඟාලෝවාද සූත්‍රය අනුව දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකමකි.

1 කුල පරපුරට අයත් සිරිත් විරිත් රැක ගැනීම.
2 යහපත් කටයුතුවල යෙදවීම.
3 තම මිත්‍රයින්ට හඳුන්වා දීම.
4 සුදුසු අවස්ථාවන්හි විවේක දීම.

26. බුදු දහම තමන්ගේ ශ්‍රාවකයින් සඳහා යෝජනා කරන්නේ

1 පටිසෝතගාමී පිළිවෙතයි.
2 භවගාමී පිළිවෙතයි.
3 අපායගාමී පිළිවෙතයි.
4 අනුසෝතගාමී පිළිවෙතයි.

27. මඩ දියෙහි ඉපිද ඉන් මතු වූ විකසිත පියුම් වැන්නෝ

1 දෙව්ලොව දෙවියෝ ය.
2 අසුර ලොව අසුරයෝ ය.
3 මිනිස් භවයක් ඇත්තෝ ය.
4 බුද්ධාදී උතුමෝ ය.

28. සමාජයේ සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ගිහි අපට භාවිත කළ හැකි උතුම් ඉගැන්වීමකි

1 ඉන්ද්‍රිය සංවරය.
2 සක්මන් භාවනාව.
3 සතර සංග්‍රහ වස්තුව.
4 සතර සතිපට්ඨානය.

29. දස අකුසල කර්ම අතරින් අකුසල මනෝ කර්මයන් වන්නේ

1 අදත්තා දානයයි.
2 සම්ඵප්ප්‍රලාපයයි.
3 ව්‍යාපාදයයි.
4 කාම මිථ්‍යාචාරයයි.

30. ඉහළ රූප ශෝභාවක් ලැබීම නිසා පෙර භවයේ අකුසල් යටපත් වී වාසනාවන්ත දිවියක් ලැබීම

1 උපධි සම්පත්තියයි.
2 ගති සම්පත්තියයි.
3 කාල සම්පත්තියයි.
4 ප්‍රයෝග සම්පත්තියයි.

31. නිත්‍ය, ස්ථිර, නොවෙනස් මම යයි ගත හැකි පදාර්ථයක් නැති බව පැහැදිලි කෙරෙන්නේ,
1 අනිත්‍ය ලක්ෂණයෙනි.
2 දුක්ඛ ලක්ෂණයෙනි.
3 අනාත්ම ලක්ෂණයෙනි.
4 භෞතික ලක්ෂණයෙනි.

32. "යේ ධම්මා හේතුප්පභවා ......... යනාදී ගාථාවෙන් තමන්ගේ ගුරුවරයාගේ දහම උපතිස්ස පිරිවැජිතුමාට හඳුන්වා දෙන ලද්දේ,

1 කොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේ විසිනි.
2 වප්ප මහ රහතන් වහන්සේ විසිනි.
3 නන්ද මහ රහතන් වහන්සේ විසිනි.
4 අස්සජි මහ රහතන් වහන්සේ විසිනි.

33. "තණ්හාව නැති වී යාමෙන් දුක නැති වී යයි " මෙම ප්‍රකාශය සඳහා ගැළපෙන මූල සූත්‍ර පාඨය තෝරන්න.

1 ඉමස්මිං සති ඉදංහෝති.
2 ඉමස්ස උප්පාදං ඉදං උපපජ්ජති.
3 ඉමස්මිං අසති ඉදං නහෝති.


For Educational Purpose Only

SLGURU.LK

SLGURU.LK

4 ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති.

34. මාර්ගාංග වශයෙන් අටකින් ද, ශික්ෂා වශයෙන් තුනකින් ද, සමන්විත වන්නේ

1 පළමු ආර්ය සත්‍යයයි.
2 දෙවන ආර්ය සත්‍යයයි.
3 තෙවන ආර්ය සත්‍යයයි.
4 සතරවන ආර්ය සත්‍යයයි.

35. බුදුරජාණන් වහන්සේ පළමු වස් කාලය ගත කළේ

1 ඇසතු බෝ රුක මුල, සමීපයේය.
2 ඉසිපතන මිගදායේය.
3 මකුල පර්වතයේය.
4 පාරිලෙයා වනයේය.

36. මේ ලෝකයේ උපන් මිනිසෙකුට ඇති උතුම්ම ලාභය ලෙස දහමෙහි දැක්වෙන්නේ,

1 සතුටයි.
2 විශ්වාසවන්තයායි.
3 නිරෝගී බවයි.
4 ධ්‍යාන ලැබීමයි.

37. අලුවිහාර සංගීතිය හෙවත් සිව්වන ථෙරවාද සංගීතියට අනුග්‍රහය දැක්වූයේ,

1 වළගම්බා රජතුමාය.
2 ප්‍රාදේශීය පාලකයෙක්ය.
3 මහසෙන් රජතුමාය.
4 දේවානම්පියතිස්ස රජතුමාය.

38 කැළණි රජමහා විහාරයෙහි පිහිටි ස්ථූප වහන්සේ,

1 ඝණ්ටාකාර වේ.
2 ඝටාකාර වේ.
3 බුබ්බුලාකාර වේ.
4 ධන්‍යාකාර වේ.

39. බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්මසාරථී ගුණය වර්ණනා කරමින් ගුරුළුගෝමී පඬිතුමා විසින් රචනා කරන ලද්දේ

1 බුත්සරණයි.
2 පූජාවලියයි.
3 ධර්ම ප්‍රදීපිකාවයි.
4 අමාවතුරයි.

40. දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ ප්‍රවාද කථාවක් ඇසුරින් දක්වා ඇති බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්මය,

1 දස සක්විතිවත් ය.
2 සතර සංග්‍රහ වස්තුව ය.
3 සතර බ්‍රහ්ම විහරණ ය.
4 පංචශීල ප්‍රතිපදාවා ය.



For Educational Purpose Only
SLGURU.LK

SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 11 | විෂය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper 11 | පැය / நேரம் / Hours 02 |

01

I බුද්ධත්වයෙන් පසු බෝධීන් වහන්සේ දෙස සතියක් ඇසිපිය නොහෙලා බලා සිටීමෙන් ලොවට දුන් ආදර්ශය කුමක්ද ?

II පැවිදි වීමට ප්‍රථම අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලාගේ නම් සඳහන් කරන්න

III " සමග්ගා හෝථ මා විවදථ " යන පාඨයේ තේරුම ලියන්න

IV " අක්කෝධේන ජිනේ කෝධං " යනාදී ධම්මපද ගාථාව අනුව මසුරුකම් කරන්නා ජය ගත යුත්තේ කෙසේද ?

V. නිබද්ධ චාරිකා යනු කුමක්ද?

VI බුදුරජාණන් වහන්සේ විසින් දමනය කරන ලද දරුණු පුද්ගලයින් දෙදෙනෙක් නම් කරන්න

VII" දානං සීලං ච නෙක්ඛම්මං
පඤ්ඤා විරියේන පඤ්චමං " මෙම ගාථාවේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න

VIII" කුසල්" යන්නෙහි අදහස ලබා දෙන තවත් වචන දෙකක් ලියන්න

IX පුද්ගල චරිත වර්ග 6 න් දෙකක් ලියන්න

X. සීලය ඇතුළත් බුදු දහමේ එන ඉගැන්වීම් දෙකක් ලියන්න



For Educational Purpose Only
SLGURU.LK

SLGURU.LK

02

I. බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලද අසරණ වූ දෙදෙනකු නම් කරන්න.

II. ගිලාන උපස්ථානය බුද්ධ පූජාවක් බවට පත් පත් කරමින් බුදුරජාණන් වහන්සේ කරන ලද ප්‍රකාශය ලියන්න.

III. ඔබ පාසැලේ බෞද්ධ සංගමයේ සභාපති තනතුරට පත්කොට ඇතැයි සිතා " ගිලානෝපස්ථානය වෙනුවෙන් සිසු ඔබට කළ හැකි දේ " පැහැදිලි කර දෙන්න.

03

I. පාරමිතා යන්නෙහි අදහස ලියන්න.

II. පාරමිතා ගුණදම් පුහුණු කිරීමේදී අත්හල යුතු කරුණු තුන සඳහන් කරන්න.

III. ඔබ කැමති පාරමිතා තුනක් සමාජයේ දියුණුව පිණිස හේතුවන අයුරු පැහැදිලි කරන්න.

04

I. බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

II. පංච නීවරණ වලින් මුල් නීවරණ තුන තේරුම් සහිතව ලියන්න.

III. පංච නීවරණ යටපත් කිරීම ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන දියුණුවට කොතරම් වැදගත් වේදැයි විමසන්න.

05

I. " අත්තනාව කතං පාපං ........ යනාදී ධම්ම පද ගාථාව ලියා දක්වන්න.

II. එහි සරල තේරුම ලියන්න.

III. " ඕනෑම අයෙකුට යහපත් දියුණු අයෙකු වීමේ වගකීම ඇත්තේ තමාටමය. අන් අයට එම තත්ත්වය බලෙන් ලබා දිය නොහැකිය " මෙම අදහස පැහැදිලි කරන්න.

06

I. සීලය යනු කුමක්ද?

II. සිල් පද ගණන අනුව එහි ප්‍රභේද තුනක් නම් කරන්න.

III. " යම් රටක මිනිසුන් සිල්වත් නොවේ නම් එම රට විනශය කරා ගමන් කරයි" අදහස් දක්වන්න.

07 පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් පමණක් තෝරා කෙටි සටහන් ලියන්න

I. අනගාරික ධර්මපාලතුමා.
II. සතර සංග්‍රහ වස්තු.
III. සිදුහත් කුමාර චරිතයේ අභියෝග.
IV. සඳකඩ පහණ.



For Educational Purpose Only

SLGURU.LK